නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடிசெத்சிரிபாயபத்தரமுல்ல
4floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HQ/MF/05/02/01

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2015/04/

දිවිනැගුම චක්‍රලේඛ අංක 2015/05/03
දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්,
දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් වෙත,

**<u>සිංහල / හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව ,ඉතුරුම් ප්‍රවර්ධන හා අළුත් අවුරුදු උත්සව වැඩසටහන - 2015</u>**

01. උක්ත චක්‍රලේඛය සම්බන්ධයෙන් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් මා වෙත ඉදිරිපත් කරන 2015/04/07 දිනැති SEC/Divineguma/01 යොමුව යටතේ වූ ලිපිය මඟින් පහත සඳහන් උපදෙස් ලබා දී ඇත.

> **''සිංහල / හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව, ඉතුරුම් ප්‍රවර්ධන හා අළුත් අවුරුදු උත්සව වැඩසටහනක් පැවැත්වීමට සංවිධානය කිරීම අගය කරමි.වර්තමාන රජයේ ප්‍රතිපත්තිය වන්නේ යහපාලනයෙන් කටයුතු කිරීමයි.ඒ අනුව බැංකු අරමුදල් අනවශ්‍ය පරිදි වැය කිරීමෙන් තොරව අරපිරිමැස්මෙන් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.කෙසේ වෙතත් මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන මඟින් අනවශ්‍ය ආකාරයට බැංකු අරමුදල් වැය කිරීමට අවස්ථා ගණනාවකදී අවසර ලබා දී ඇත.මෙය යහපත් තත්ත්වයක් නොවන බව අවධාරණය කරන අතර අළුත් අවුරුදු උත්සව පැවැත්වීමේ දී විවිධ සංවිධාන / බාහිර පාර්ශව වල සහය සහ ආධාර ලබාගෙන ප්‍රජා සහභාගීත්වය ද සහිතව සංවිධානය කිරීම වඩා සුදුසු වන බැවින් ඒ අනුව කටයුතු කිරීමට මෙමඟින් උපදෙස් ලබා දෙමි.''**

02. අඛණ්ඩව පසුගිය අවුරුදු වල පැවැත්වූ අයුරින්, 2015 වර්ෂය ද සිංහල / හින්දු අළුත් අවුරුදු උත්සවය වැඩසටහන දිවිනැගුම බැංකු කලාප තුල, උත්කර්ෂවත් ලෙස පැවැත්විය යුතුය.ඒ සඳහා ඔබ බැංකු කලාපයේ සියලු ම ග්‍රාමීය ප්‍රජාමූල සංවිධාන මූලික කරගෙන, ඔවුන්ගේ සංවිධානය මත සිදුකල යුතුය.ඒ සඳහා දිවිනැගුම බැංකු කළමණාකරු හා දිවිනැගුම නිලධාරින් අවශ්‍ය නායකත්වය හා මඟපෙන්වීම පමණක් සිදුකල යුතුය.

03. ඉහත කී උපදෙස් අනුව සිංහල / හින්දු අළුත් උත්සවය ජන ක්‍රීඩාවලට මුල් තැන දෙමින්, සාර්ථක අවුරුදු උත්සවයක් පැවැත්වීමට කටයුතු කිරීම අගය කොට සලකමි.

**2015 සිංහල / හින්දු අළුත් අවුරුද්ද ඔබ ඇතුළු කාර්ය මණ්ඩලය හා පාලක මණ්ඩල / විධායක කමිටු සාමාජික සියළු දෙනාට සුභ අළුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමි.**

එච්.සුමනපාල
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-
01) ලේකම්, නිවාස හා සමෘද්ධි කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ස.
02) සියලු ම දිස්ත්‍රික් ලේකම්වරු - කා.දැ.ස.
03) සියලු ම ප්‍රාදේශීය ලේකම්වරු - කා.දැ.ස.
04) සියලු ම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් - කා.දැ.ස.
05) ප්‍රධාන අභ්‍යන්තර විගණක - කා.දැ.ස.


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂජනරාල් / மேலதிகபணிப்பாளர்தலைமையதிபதி / Additional DirectorGeneral | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர்(நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/தொலைபேசி/Telephone: | 011-2872202 | 011-2861994 | 011-2873799 | 011-2889046 |
| ෆැක්ස්/தொலைமடல்/Fax: | 011-2889002 | | 011-2873996 | 011-2887722 |
| ඊ-මේල්/ மின்னஞ்சல்/E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |